දේවි බාලිකා විද්‍යාලය - කොළඹ

Devi Balika Vidyalaya - Colombo

පළමු වාර පරීක්ෂණය - 2012

First Term Test - 2012

සිංහල භාෂාව හා සාහිත්‍යය

10 ශ්‍රේණිය

පැය 1 1/2

නම : ......................................................................

විභාග අංකය : ..................

## 1 - කොටස

* අංක 1 - 25 දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(01) පහත දැක්වෙන වාක්‍යයන්හි ඉරි ඇඳි වචනයේ අර්ථයට සමාන තේරුමක් ඇති වරණය තෝරන්න.

01) ඉඩමේ උරුමය පැවරීම ගැන <u>හිතේ කහටක්</u> ඇති ගන්නට එපා යයි තාත්තා පැවසීය.

1. වෛරයක් 2. කුතුහලයක් 3. අකමැත්තක් 4. අමනාපයක්

02) <u>කොලේ වහලා</u> ගැහීමෙන් මේ කාරණය නිරාකරණය කළ නොහැකි බව ආයතනප්‍රධානියා පැවසීය.

1. ඇත්ත වසන් කිරීමෙන්
2. සත්‍ය ප්‍රකාශ කිරීමෙන්
3. මුසා ප්‍රකාශ කිරීමෙන්
4. පක්ෂග්‍රාහී වීමෙන්

03) ස්වකීය අභිමතාර්ථ සාධනයෙහි ලා කවරෙකු හෝ <u>දඩමීමා කර ගැනීමට</u> හෙතෙම පසුබට නොවේ.

1. ආරක්ෂා කර ගැනීමට
2. අනතුරට පත් කිරීමට
3. වර්ණනාවට ලක් කිරීමට
4. අනිසි ආධාරකයන් ලෙස යොදා ගැනීමට

* හිස්තැනට වඩාත් සුදුසු වචනය තෝරන්න.

04) පාසල ගොඩනැගීමෙහි ලා අප ලද මහජන ........................................ කාගේත් සැලකිල්ලට භාජනය විය.

1. අනුග්‍රහය 2. විග්‍රහය 3. නිග්‍රහය 4. අව ග්‍රහය

05) මහා සභාව ආරම්භ කරන ලද්දේ ........................................ චාරිත්‍රයට අනුව මගුල් බෙර වාදනය කරමිනි.

1. අනාගත 2. විරාගත 3. විලාසිතා 4. සමාහිතා

* පහත දැක්වෙන පේළිවල මුලින් යෙදී ඇති වචනයට දෙවෙනි වචනය අර්ථයෙන් සමානද විරුද්ධද වෙනස් ද යන්න තෝරන්න.

06) ආකුල - ව්‍යාකුල

1. සමාන 2. විරුද්ධ 3. අඩු 4. වැඩි

07) නිපුණ - ආධුනික

1. සමාන 2. විරුද්ධ 3. අඩු 4. වැඩි

08) කුඩුකේඩු - කුම්මැහි

1. සමාන 2. විරුද්ධ 3. අඩු 4. වෙනස්

* හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

09) කවියෝ වෙනත් අයගේ අත්දැකීම් ................................... රසවත් කාව්‍ය නිර්මාණ රචනා කරති.
1. පාදක කර ගනිමින්
2. ප්‍රතියෝජනය කරමින්
3. ප්‍රතිනිර්මාණය කරමින්
4. ප්‍රතිපෝෂණය කරමින්

10) සෝරත මා හිමියන් විසින් ලියූ ලිපි එවක ................................ විස්මයට පත් කළේය.
1. ලේඛකයන්
2. විද්වතුන්
3. සහෘදයන්
4. පාඨකයන්

11) මුලින් යෙදී ඇති පදයේ අර්ථයට සමාන අර්ථයක් නොදෙන පදයක් සහිත පද පේළිය තෝරන්න.
1. ඉච්ඡාව - අභිප්‍රාය , අභිමතය , අභිමානය , අභිලාසය
2. අවසානය - නිෂ්ටාව , අන්තය , කෙළවර , සමාප්තිය
3. මුහුද - සමුද්‍රය , සයුර , රුවනාර , සිඳු
4. ප්‍රසිද්ධ - පුවතර , පරසිඳු , පතළ , ප්‍රකට

12) අහස - නුබ , අඹර , ගුවන , අමර
ජලය - අඹ , දිය , වතුර , පැන්
ඉක්මනින් - ශීඝ්‍රයෙන් , කඩිනමින් , සෙඳින් , වහ වහා
නිරතුරු - නිති , සතතින් , නිබඳ , නිතර

13) පරිණත - වැඩුණු , පැසුණු , මේරූ , නැමුණු
පිළිසරණ - උදව් , උපකාර , සහය , ආධාර
නිපුණ - දක්ෂ , ප්‍රවීණ , පුහුණු , පළපුරුදු
ඖෂධ - ඔසුව , බෙහෙත , ඖෂධය

14) මුලින් යෙදී ඇති ව්‍යාකරණ ගණයට අයත් නොවන පදයක් හෝ පද යෙදී ඇති වරණය තෝරන්න.
1. ක්‍රියා - දුවමින් , බැලීය , කරව , යද්දී
2. නිපාත - පිණිස , විසින් , සඳහා , සමග
3. සන්ධි - සිත්තම , ඇඩුවම , සහෝදර , ගුරුතුමා
4. අව්‍යපද - සුදන , අකුසල් , අවසානය , දුර්ගුණ

15) මුලින් යෙදී ඇති පදයේ විරුද්ධාර්ථය දෙන පදය වන්නේ,
1. කාලය - සමය , අන්තරය , අවධිය
2. විනෝදය - විවේකය , අපේක්ෂාව , විරාමය
3. උත්සාහය - උදාසීනත්වය , ප්‍රසංශාව , උන්නතිය
4. අනර්ඝ - උත්තම , මහාර්ඝ , අනල්ප

16) 'ළමයා' යන පදයේ අනුක්ත බහු වචනය වන්නේ,
1. ළමයෝ
2. ළමයි
3. ළමෝ
4. ළමයින්

17) 'නයා' යන පදයේ අනුක්ත බහුවචන පදය වන්නේ,
1. නයින්
2. නයෝ
3. නයි
4. නයෙක්

18) බලති යනු
1. ප්‍රථම පුරුෂ , බහු වචන , කර්තෘකාරක , වර්තමාන කාල ක්‍රියා පදයකි
2. උත්තම පුරුෂ , බහු වචන කර්ම කාරක ක්‍රියා පදයකි
3. මධ්‍යම පුරුෂ බහුවචන කර්මකාරක ක්‍රියාපදයකි
4. ප්‍රථම පුරුෂ බහුවචන කර්මකාරක ක්‍රියාපදයකි

19) නිවැරදිව සන්ධිකර ඇති වරණය තෝරන්න.

1. සම + උපකාර - සමුපාකාර
2. අති + අලංකාර - අත්‍යාලංකාර
3. අති + උදාර - අත්‍යෝදාර
4. ශිෂ්‍ය + උන්නතිය - ශිෂ්‍යෝන්නතිය

20) 'සමාන්තර' යන පදය සෑදී ඇත්තේ මින් කවර දෙපදය එක්වීමෙන්ද ?

1. සං + අන්තරය 2. සම + අන්තරය 3. සමාන + අන්තර 4. සම් + අන්තර

21) අකාරාදී පිළිවෙළ නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

1. දඹාන , මඩකලපුව , මහනුවර, හම්බන්තොට , හලාවත
2. මහනුවර , දඹාන , හම්බන්තොට , හලාවත , මඩකලපුව
3. මඩකලපුව , හලාවත, මහනුවර , දඹාන , හම්බන්තොට
4. දඹාන , හලාවත , හම්බන්තොට , මඩකලපුව , මහනුවර

22) ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

1. නිලධාරින් මෙන්ම ලිපිකරුවෝද එතැන රැස්වී සිටියහ.
2. ඔබ විසින් එවන ලද ලිපිය ලැබුණෙමි.
3. විද්‍යාඥයන් වනාහි නව සොයාගැනීම් කරන අයයි
4. අම්මත් නංගීත් තාත්තා සමග පෙරහැර බැලීමට ගියාය.

23)
1. ඕ තොමෝ මිත්තනියක් දැක තුටුවෙති
2. පයින් යන්නෝ දකුණු පසින් යා යුතුය.
3. ගොවීන් විසින් කුරුල්ලෝ එළවනු ලැබූහ
4. සියලුම ළමයින් පාසල් වත්ත ශුද්ධ පවිත්‍ර කළහ

24)
1. මම උගතෙකු වෙමි
2. ශිෂ්‍යනායිකාව දක්ෂ ක්‍රීඩිකාවකි
3. ඔවුහු විදේශවලින් පැමිණි නියෝජිතයන් වූහ
4. ජිනදාස කෙටි කතා ලිවීමේ හපනකුවේ

25) හිස් තැනට ආ යුතු පදය ලියන්න.

........................................ රැස්වීමට පැමිණෙන බව බොහෝ දෙනෙක් දැන සිටියහ.

1. සාමාජිකයන් සියල්ලන්ම
2. සාමාජිකයෝ සියල්ලෝම
3. සාමාජිකයෝ සියල්ලන්ම
4. සාමාජිකයන් සියල්ලෝම

(02) අංක (1 - 10) දක්වා ඇති ප්‍රශ්නයන්ට කෙටි උත්තර සපයන්න.

1. දු : ඛ , තු : යනු විසර්ගය යෙදුණු වචන දෙකකි. ඒ අනුව,

   අ) අනුස්වාරය යෙදුණු වචනයක් ලියන්න.

   ආ) අන්තඃ ස්ථාක්ෂරයක් මූලට යෙදුණු වචනයක් ලියන්න.

2. පහත දැක්වෙන වාක්‍ය වැරදි නම් නිවැරදි කරන්න.

   අ) ඇගේ සිත පැරුණාය.

   ආ) රජ තෙමේ පෙරහැරින් නුවරට ළගා වූහ.

3. පහත දැක්වෙන පුවත්පතක වැරදි ලෙස ලියන ලද වචන කීපයකි. ඒවා නිවැරදි කරන්න.

   අ) විශ්මය , නිශ්පාදනය

   ආ) අභාෂය , විලාශය

4. පහත ප්‍රස්තාව පිරුළුවල ඉතිරිපද සම්පූර්ණ කරන්න.

අ) නිවට ඇම්බැට්ටයා දුටුවා ................

ආ) නොදන්නා දෙමලෙට ගිහින් .........

5. පහත දැක්වෙන වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

අ) ගොවියෝ ගවයන් ආරක්ෂා කළහ.

ආ) ලිපිකරුවෝ අප හමුවූහ.

6. නුවණ යනු ඥාණය නම් පහත දැක්වෙන වචන දෙකෙහි අර්ථය ලියන්න.

අ) පහළ ආ) පතල

7. අ) පූර්ව ක්‍රියා රූපයකින් මිශ්‍ර ක්‍රියා රූපයක් සාදාගන්නා ආකාරය ලියාදක්වන්න.

ආ) අසම්භාව්‍ය ක්‍රියාවේ කොටස් දෙක ලියා දක්වන්න.

8. සරළ යන්නෙහි විරුද්ධ පදය සංකීර්ණ නම් පහත දැක්වෙන පදවල විරුද්ධාර්ථ පද ලියන්න.

අ) අනිවාර්ය ආ) ආගන්තුක

9. කොල්ලා හමුදාවට බැඳුණ ලු

ඔබ ම ආ යුතුය.

ඉරි ඇඳි පද කුමන අර්ථවල යෙදෙන නිපාත යන්ද ?

10. නිවස අවට පදිංචිව් සිටින අය යන්නේ තනිවචන අසල්වැසියෝය. පහත දැක්වෙන ඒවායේ තනි පදය ලියන්න.

අ) නිවසේ වාසය කරන අය

ආ) දේශයට ආදරය කරන

* අංක 1 - 10 දක්වා ඇති ප්‍රශ්නයන්ට කෙටි පිළිතුරු ලියන්න.

03) 1. මං තවත් අඩන්න පටන් ගත්තා මට පොළොවේ හැපි හැපී ඇඬුවේ වෙන කරන්න දෙයක් නැතුව.

අ) මෙසේ ඇඬුවේ කවුද ?

ආ) මෙසේ ඇඬීමට හේතුව ලියන්න.

2. අ) 'අපටත් දවසක ඉරපායාදෝ' කෙටි කතාවේ රචකයා කවුද ?

ආ) එය උපුටාගත් කෙටිකතා සංග්‍රහයේ නම කුමක්ද ?

3. පදමට වෙරළු මිණි කැට සුණු විසුළ හැඩ
ජෝතිය ලැගුම් පත් ළා තණ පිටිය උඩ
අ) මෙම පද්‍යයේ ඉරිති පද දෙක සම්පූර්ණ කරන්න.
ආ) මෙම මුල් පද දෙකේ තේරුම ලියන්න.

4. වෙහෙසට පත්ව වට වැසි බිඳු පොකු ගිල
දියවැල් වමාරන්නා මෙනි පියසි තල
මෙහි ඇති උපමාව හා උපමේය වෙන් කොට ලියන්න.
අ) උපමාව ආ) උපමේය

5. අ) වැස්ස පද්‍ය පන්තියේ රචකයා කවරෙක්ද ?
ආ) ඔහුගේ වෙනත් නිර්මාණ දෙකක් ලියා දක්වන්න.

6. 'බලන්න මේ මූණ දිහා හරියට පණ පිටින් වගේ'
අ) මෙසේ ප්‍රකාශ කලේ කවුද ?
ආ) මෙසේ විස්තර කරන්නේ කුමක් ගැනද ?

7. 'උඹ වරෙන් ගෙදර යන්ඩ අසරණ අපට ඔය පරුවත එක්ක හැප්පෙන්න බැහැ'
අ) මෙය කාගේ ප්‍රකාශයක්ද ?
ආ) පරුවත යනුවෙන් මෙහි සංකේතවත් කරනු ලබන්නේ කවුරුන්ද ?

8. අපටත් දවසක ඉර පායාදෝ කෙටි කතාවේ දැක්වෙන ඉඟිවැකි දෙකක් ලියන්න.
අ) ................................................
ආ) ................................................

9. පහත දැක්වෙන වචනවල අර්ථය ලියන්න.
අ) වසගත්තුවට
ආ) කනිපින්දම්

10. පහත දැක්වෙන ප්‍රශ්නයන්ට පිළිතුරු ලියන්න.
අ) මේ කුලු ගැටෙන හඩ යන්නෙහි අර්ථය ලියන්න.
ආ) වැස්ස පද්‍ය පන්තියේ දැක්වෙන උපමා දෙකක් ලියන්න.

(04) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

අපගේ ජන ජීවිතයේ නෛසර්ගික ලක්ෂණ පිළිබිඹු කරන දර්පන තලය අපගේ සංස්කෘතියයි. එම සංස්කෘතික පරිසරය විසින් සකස් කරන ලද භාවමය ජීවිතයක් ඇති අපගේ සිත් සතන් සංස්කෘතියෙන් නැගුණ මුල් හා බැඳි පවතී. එහෙයින් අපගේ රසඥතාව ද අපගේ සංස්කෘතියේ සහජ ගුණ හා බැඳි ඇත. අපගේ සංස්කෘතියට අයත් භාවමය ජීවිතය හෙළි කරන ජනකලා පරීක්ෂා කර බලන්නා ඒ ජන කලාවල උරුම කියන ජනයාගේ රසඥතාව හොඳ හැටි හැදින ගනියි. ඔවුන් සහෘදයන් බවට පත් කරවිය හැකි කලා කෘති නිර්මාණය කිරීමේදී යට කී රසඥතාව හැදින ගැනීම අර්ථවත්වේ.

1. මේ ඡේදයට අනුව අපේ රටේ කලා කරුවන් අවබෝධ කරගත යුතු මූලිකම කරුණු කුමක්ද ?
2. රසඥතාව හැදින ගැනීමට පරීක්ෂා කළ යුත්තේ කවරක්ද ?
3. සැබෑ සහෘදයන් බවට ජනයා පත් කර ගන්නේ කෙසේද ?
4. ජන කලා මගින් හෙළිකරන්නේ මොනවාද ?
5. දර්පන තලය , නෛසර්ගික යන වචන වල අර්ථය ලියන්න.